සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 02 යි<br>02 மணி நேரம்<br>02 Hours |
| සිංහල භාෂාව හා සාහිත්‍යය - I.II<br>சிங்கள மொழி மற்றும் இலக்கியம்- I, II<br>Sinhala Language And Literature - I II | 09 ශ්‍රේණිය<br>தரம் 09<br>Grade 09 |

## I කොටස

- I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 3 දක්වා පහත සඳහන් ප්‍රකාශවල ඉරි ඇඳි පදවලට වඩාත් සමීප පදය තෝරන්න.

01) ලොතරැයි ජයග්‍රහණයක් හේතුවෙන් ඔහුගේ අතමිට සරු වී ඇති බව ගම්මු පවසති.

i. සෙනසුරා ලබලා　　ii. කරල පැහිලා
iii. අත්තන ඇට කැවිලා　　iv. පොරකටු ගෙවිලා

02) ඉතා තද වැස්ස හේතුවෙන් පහත් බිම් ජලයෙන් යටවිය.

i. පොද වැස්ස　　ii. මල් වැස්ස　　iii. නා කපන වැස්ස　　iv. අක්වැස්ස

03) කළුවා මාරපන ගියා වගේ මින් මතු කටයුතු නොකරන ලෙස ප්‍රධානියා තම සේවකයාට අවවාද කළේය.

i. අනවබෝධයෙන් යමක් කිරීම　　ii. නම්බුවත් වගකීමක් නැතිව වැඩ කිරීම
iii. කිසිවකුටත් කළ නොහැකි දෙයක් කිරීම　　iv. බාහිර අවධානයට පමණක් වැඩ කිරීම

04) මුලින් දී ඇති යුගල පද වර්ගයට අයත් යුගල පදය තෝරන්න.

මිල මුදල්

i. එහෙ මෙහෙ　　ii. ළමයි බමයි　　iii. උඩක් බිමක්　　iv. සමිති සමාගම්

05) පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. ජ, ක අකුරු කණ්ඨජ ය　　ii. ණ, ඨ අකුරු මූර්ධජ ය
iii. ප,බ අකුරු ඕෂ්ඨජ ය　　iv. ද,ම අකුරු දන්තජ ය

06) සිංහල අක්ෂර මාලාවේ "තල්ල ආශ්‍රයෙන් උපදින අකුරු"

i. කණ්ඨජ ය. ii. තාලුජ ය. iii. ඕෂ්ඨජ ය. iv. මූර්ධජ ය.

07) "වනය" යන්නට සමාන පදයක් නොවන්නේ,

i. කැලෑව ii. හිමකර iii. මූකලාන iv. වල

08) සුසිරිත් යන්නෙහි විරුද්ධාර්ථ පදය වන්නේ,

i. දුසිරිත් ii. මනාසිරිත් iii. පරසිරිත් iv. යහසිරිත්

09) සෑම පදයකම නිවැරදි අක්ෂර වින්‍යාසයක් සහිත වරණය කුමක්ද?

i. මර්ධනය, වර්තමාන, සම්භාවනීය, පරිණාමය

ii. පිළිවෙල, විෂ්වය, ප්‍රශස්ති, මධ්‍යස්ථ

iii. ප්‍රස්තාව පිරුළු, සමස්ත, ශිෂ්ටාචාරය, පිළිසඳර

iv. ගෘහස්ත, නිශ්පාදනය, පිළිතුරු, තීක්ෂණ

- මුලින් දී ඇති පදයට බහු අර්ථයක් නොදෙන පදය තෝරන්න.

10) කර

i. හොඬ ii. මුහුණ iii. බෙල්ල iv. අත

11) "පාද බොහෝ ගණනක් ඇති" යන අදහස දෙන තනි පදය නම්,

i. අපා ය. ii. බහුපා ය. iii. දෙපා ය. iv. සිවුපා ය.

12) නිත්‍ය බහු වචන පදයක් නොයෙදුණු වරණය වන්නේ,

i. අයෙක්, ඇතමෙක්, සමහරෙක්, ඒ අය

ii. සමහරු, කවුරු, පුද්ගලයෙක්, අයෙක්

iii. කවරහු, ඇතැමෙක්, බොහෝ දෙන, අයෙක්

iv. සමහරෙක්, කෙනෙක්, කවුරු, අයෙක්

13) අකාරාදී පිළිවෙළට වචන යෙදූ පද පේළිය වන්නේ,

i. පිළිහුඩුවා, සැළලිහිණියා, පරෙවියා, කපුටා

ii. ගිරවා, මයිනා, කොකා, හංසයා

iii. ඇත්කඳ ලිහිණියා, කපුටා, මොනරා, හංසයා

iv. පොල්කිච්චා, දෙමලිච්චා, කැරලා, සුදුරෙදි හොරා

14) රේඵය, ගයනුකිත්ත, රකාරාංශය පිළිවෙළින් ඇතුළත් පිළිතුර නම්,

i. පූර්‍ව, ගෞරවය, ක්‍රමය ii. ධර්‍මය, ත්‍රිපිටකය, ප්‍රකාශය

iii. පූර්‍ව, වෛරය, ගෞරවය iv. මෞලි, ප්‍රකාශය, මානුෂීය

15) සමූහාර්ථවාචී පද පමණක් යෙදුණු පිළිතුර වන්නේ,

i. අයෙක්, කෙනෙක්, ඇතැමෙක්, කවුරු

ii. පෙළ, පිරිස, රංචුව, කණ්ඩායම

iii. මිනිසෙක්, ළමයෙක්, දැරියක, බල්ලෙකු,

iv. ආණ/ අණු/ අණි/ ඕ

16) උක්ත පදයක් ඇතුළත් නොවන වරණය වනුයේ,

i. මිනිසෙක්, කාන්තාවක්, කුරුල්ලෝ, ඔවුහු

ii. මම, තොපි, කාන්තාවක්, ගංගාවෝ

iii. රිතීහු, ඔවුහු, ගායකයෝ, සිංහයෙක්

iv. වෘක්ෂයෝ, කාන්තාවන්, අපි, දැරියක්

• ඉරි ඇඳි පද කවර ව්‍යාකරණ ගණයට අයත් දැයි දක්වන්න.

17) අපි දෙමාපියන් <u>නැමැඳ</u> පාසලට පැමිණියෙමු.

i. මිශ්‍ර ක්‍රියා ii. ප්‍රයෝජ්‍ය ක්‍රියා iii. පූර්ව ක්‍රියා iv. විධි ක්‍රියා

18) ඔවුහු රිය අනතුරට ලක් වූවන් රෝහල වෙත <u>වහ වහා</u> රැගෙන ගියහ.

i. ක්‍රියා විශේෂණ ii.නාම විශේෂණ

iii. මිශ්‍ර ක්‍රියා iv.උපසර්ග

19) විල් ජලයේ ගොහොරු මඩේ <u>සුදු රතු</u> සියපත් පිපේ........

i. ක්‍රියා විශේෂණ ii. අනියමාර්ථ පද

iii. උපසර්ග iv. නාම විශේෂණ

20) "පොලිස් භටයෙක් සොරෙකු ලුහුබඳියි" යන වාක්‍යය කර්ම කාරකයේ යෙදුණු විට නිවැරදි පිළිතුර වන්නේ,

i. "පොලිස් භටයෙක් විසින් සොරෙක් ලුහුබඳියි" යන්නයි.

ii. " පොලිස් භටයෙකු විසින් සොරෙකු ලුහුබැඳෙයි" යන්නයි.

iii. පොලිස් භටයන් විසින් සොරෙක් ලුහුබඳියි යන්නයි

iv. පොලිස් භටයෙකු විසින් සොරෙක් ලුහුබැඳෙයි යන්නයි.

(ලකුණු $2\times20-40$)

## II කොටස

- පළමු හා දෙවන ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වේ.
- 3,4,5,6,7,8 ප්‍රශ්නවලින් ඔබ කැමති ප්‍රශ්න 3 ක් තෝරා ගන්න.
- පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතුය.

01. කෙටි පිළිතුරු සපයන්න.

I. "මැණියනි, මම ඔබ ශ්‍රී පාදයට කැඳවාගෙන යමි" මෙසේ ප්‍රකාශ කළේ කවුද?

II. "ලප සේ සඳ විලසේ" පාඩම උපුටාගත් කෘතිය කුමක්ද?

III. අසහාය කලාකරු ආචාර්ය එස්. පණිභාරතයන් සිය සුවිශේෂී දක්ෂතා දැක්වූ එක් ක්ෂේත්‍රයක් නම් කරන්න.

IV. "දේශානුරාගය" යන්න හඳුන්වන්න.

V. පහත වචනවල අර්ථ ලියා දක්වන්න.
නිකෘෂ්ට ජීවිකා, කිඳලෙකි

VI. ආරාධනා පත්‍රයක ඇතුළත් විය යුතු අංග දෙකක් ලියන්න.

VII. ගැමියන් "හෝ ගාන පොකුණ" ලෙස හඳුන්වන්නේ කුමක්ද?

VIII. ලාංකේය කලාවේ ගාම්භීරත්වය බටහිරට හඳුන්වා දෙමින් ආචාර්ය ආනන්ද කුමාරස්වාමි රචනා කළ ග්‍රන්ථය කුමක්ද?

IX. "මා විසින් පොතක් කියවනු ලැබේ" යන්න කර්තෘකාරක වාක්‍යයක් බවට හරවන්න.

X. "ගුරුවරුන් සිසුහු හික්මවති" යන වාක්‍ය නිවැරදි කර ලියන්න

(ලකුණු 10)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.

1. තරුණ ශ්‍රමය රටේ දියුණුවට යොදවමු.
2. කැළිකසළ නිසිලෙස බැහැර කරමු.
3. වස විසෙන් තොර ආහාර රටාවකට මඟ
4. ආගම මගින් සදාචාරවත් සමාජයක්
5. මගේ අනාගත ඉලක්ක ජයගන්නේ කෙසේද?

03.

i) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

1. වෙළෙන්දෝ බඩු විකුණති.
2. අපි අසරණයන්ට කෑම දුන්නෙමු.
3. කතුවරිය ග්‍රන්ථයක් එළිදැක්වූවාය.
4. ජනාධිපතිවරයා රටවැසියන් අමතයි.
5. ගුරුවරු සිසුන් යහමඟ යවති.

ii) පහත වාක්‍ය කර්තෘ කාරකයට හරවාලියන්න.

1. මා විසින් පොතක් කියවන ලද්දේය.

2. ගොවියන් විසින් කුඹුරු වගා කෙරිණි.

3. පොලිස් නිලධාරීන් විසින් විරෝධතා කරුවෝ පළවා හැරුණහ.

4. පූසා විසින් මීයෝ ඇල්ලෙති.

5. ඔවුන් විසින් නීතිඥවරයෙක් අමතන ලද්දේය. (ලකුණු 10)

04. පහත වාක්‍යවල හිස්තැන් පිරවීමට සුදුසු නිවැරදි පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. .......................(ඔවුහු/ඔවුන්) එම ව්‍යාපාරයේ මුල්තැන ගත්හ.
2. .......................(ලේඛිකාවක/ලේඛිකාවක්) රසවත් කෙටි කතාවක් ලියයි.
3. .......................(අපි/අප) තාක්ෂණික ක්‍රම ඔස්සේ අධ්‍යාපනය ලබමු.
4. .......................(තාරකාවෝ/තාරකාව) රෑ අහසේ දිලිසෙයි.
5. .......................(ළමයෙක්/ළමයෙකු) වේදනාවෙන් කෑ ගසයි.
6. පියාණෝ දරුවන්ට අවවාද .......................(දෙය/දෙති)
7. සිංහ රැළ සතුන් පන්නා .......................(දමය/දමති)
8. ගස් පෙළ පරිසරය අලංකාර .......................(කරය/කරති)
9. ඇතැමෙක් නගරයෙන් නගරයට ගොස් භාණ්ඩ .......................(විකුණයි/විකුණති)
10. අප ප්‍රදේශයේ එක් අයෙක් වාදන තරගයට ඉදිරිපත් .......................(වෙයි/වෙති)

(ලකුණු 10)

05. පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

සාහිත්‍යය යනු භාෂාව මාධ්‍ය කොටගෙන හැඟීම් ප්‍රබලාකාරයෙන් දැනවීම සඳහා මානවයා ගොඩනඟාගත් මාර්ගයකි. ගද්‍ය, පද්‍ය හා චම්පූ යනුවෙන් සාහිත්‍යයේ ප්‍රධාන ප්‍රභේද තුනකි. පද්‍යය යනු තාලානුකූලභාවයෙන් යුක්ත වන සේ කරන ලද පද සංයෝජනයකි. සිංහල පද්‍යයට, සිංහල භාෂාවේ ඉතිහාසය තරමටම දිගු ඉතිහාසයක් පවතී. සිංහල පද්‍ය නිර්මාණයට බොහෝ විට වස්තු වූයේ බුදු සිරිත හෝ බෝසත් සිරිතය. මෙය පැරණි කවීන් අතර සම්මුතියක් බඳු විය. සම්භාව්‍ය සිංහල සාහිත්‍ය, පාලි හා සංස්කෘත මෙන් ම දෙමළ සාහිත්‍යය ද ඇසුරෙන් සකස් වූවකි. සහජ කවීත්වයත් පෘථුල සංස්කෘතික විඥානයක් සහිතව සම්භාව්‍ය සාහිත්‍යයෙන් බැහැර වූ සාහිත්‍ය ධාරාවක් ද පැතිර ආවේය.

1. සාහිත්‍යය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි ලියන්න.

2. පද්‍ය සාහිත්‍යය යනු කුමක්ද?

3. පැරණි කවීන් ස්වකීය කාව්‍ය නිර්මාණයන්හි දී බොහෝ විට වස්තු විෂය කරගත්තේ කවරක්ද?

4. සම්භාව්‍ය සිංහල සාහිතය සකස් වීමට බලපෑ වෙනත් සාහිත්‍ය අංශයන් මොනවාද?

5. සාහිත්‍යයේ ප්‍රභේද කීහිපයක් ඡේදයේ සඳහන් වේ. ඒවා මොනවාද?

(ලකුණු 10)

06. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දේද යන්න ලියා දක්වන්න.

1. "පුත, ඔබ බෝසත්වරයෙකි. ඔබට බුදුබව ලැබේවා යි ප්‍රාර්ථනා කරමි"

2. "ස්වාමීනි, මෙලොව මෙයට වඩා පියයුත්තෙක් නැත"

3. "අනේ අම්මේ, ඔබේ දැන් තත්ත්වය හැටියට කෙසේ ශ්‍රී පාද ගමන කළ හැකිද?"

4. "අනඳයෙනි, මහධන සිටාණන්ගේ පුතණුවන් දුටුවාද?"

5. "රටේ විවිධ ප්‍රදේශවල කලායතන බිහි කරන්නටත්, ඒවාට අවශ්‍ය උපදෙස් හා සොයා බැලීම් කරන්නටත් එතුමා පුරුදුව සිටියා."

07. පහත පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිහා නගන කටහඬ නොම වැකෙන කනේ
ඇත මේ කුරුලු කුඩුව උස ගසක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුනේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදූල්ලෙහි
පැටවා කැමති නැත සිර වී විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමුවන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මව්පිය කුරුල්ලන්ගේ රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජ මුතුව
පැටවා දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිලෙන්නට නැතුව

1. ඉහත කවි පෙළට වස්තු විෂය වී ඇත්තේ කුමක්ද?
2. කුරුලු කුඩුව පිහිටා ඇති ස්ථානයේ ස්වභාවය විස්තර කරන්න.
3. කුරුලු පැටවාගේ දෙනෙත රතු වීමට හේතුව කුමක්ද?
4. කුරුලු පැටවා සොයන "යම් දෙයක්" පිළිබඳව මෙහි කියවේ. ඒ කුමක්ද?
5. කුරුලු පැටවා සොයන "යම් දෙයක්" පිළිබඳව මෙහි කියවේ. ඒ කුමක්ද?

(ලකුණු 10)

08. ඔබ පාසලේ තෑගි බෙදා දීමේ උත්සවයක් පවත්වන්නට තීරණය කර ඇතැයි සිතන්න. එකී උත්සවය සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(ලකුණු 10)